**ශීර්ෂය - 16 පාර්ලිමේන්තුව**

**------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1** **මතය**

**-------**

පාර්ලිමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූලි 18 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 25 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ට අනුව, නිවැරදි වියදම් තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 02 ක හා මූලධන වැය විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණු අතර මූලධන වැය විෂයයන් 09 ක හා පුනරාවර්තන වැය විෂයයන් 13 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 99.5 ක අතර පරාසයක ඉතිරිවීම් විය. | එකඟ වෙමි. කොවිඩ් වසංගතයේ බලපෑම හා රටෙහි පවතින ආර්ථික තත්ත්වය හමුවේ අපේක්ෂා කළ පරිදි අයවැය යටතේ වියදම් ඇති නොවීම නිසා මෙම තත්ත්වය ඇති විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, නිවැරදි වියදම් තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත CA 82 හා මූල්‍ය ප්‍රකාශනවල සටහන **(iii)** හි බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණ සමාලෝචිත වර්ෂයට අදාල රු. 18,968,618 ක බැරකම් 2022 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට මූල්‍ය අංශයට විස්තර සොයා ගැනීමට නොහැකිවූ බැඳීම් හා බැරකම්වලට අදාල අගයන් බැරකම් ප්‍රකාශයනයෙහි ඇතුළත් වී නොමැති අතර ඉදිරියේ දී මෙම තත්ත්වය අවම වන අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ ආකෘතීන්වල නිවැරදිව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

#### 3.1.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2021 අප්‍රේල් 28 දින සංශෝධනය කර තිබුණු නමුත්, ඇස්තමේන්තු පිරිවැය රු.20,954,882 ක් වූ කාර්යයන් 12 ක් වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | 2021 අප්‍රේල් 28 දින ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමෙන් පසුව රු.20,954,882 ක් වූ කාර්යයන් 12 ක් ක්‍රියාත්මක කිරීමට සිදු වූ අතර එයින් රුපියල් මිලියන 5 කට වැඩි ප්‍රමාණයක් දැරීමට සිදුවූයේ අකුණු සැර වැදීම හා විදුලිය පද්ධතියේ සිදු වූ දෝෂ නිසා පරිශ්‍රයේ දේපල වලට සිදු වූ හානි පූර්ණය කිරීමටය. මීට අමතරව විවිධ කාර්යාලවල ප්‍රමුඛ අවශ්‍යතාවයන් ලෙස කාර්යාල උපකරණ ලබා ගැනීම වැනි කරුණු නිසා 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමෙන් පසුව කාර්යයන් 12 ක් ක්‍රියාත්මක කිරීමට සිදු විය. | වර්ෂය තුළ සිදුකරනු ලබන ප්‍රසම්පාදන කාර්යයන් සියල්ලම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාර්යයන් සඳහා වෙන්කළ මුළු ඇස්තමේන්තු පිරිවැය රු. 239,964,070 තුළ ඇතුළත් ඇස්තමේන්තු පිරිවැය රු. 176,600,000 ක් වූ කාර්යයන් 10 ක් ඉටු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් රු.143,100,000 ක් පිරිවැය ඇස්තමේන්තු කර තිබූ කාර්යයන් 08 ක් කොරෝනා වසංගත තත්ත්වය නිසා රට වසා දැමීම හේතුවෙන් ඉටු කළ නොහැකිවූ අතර රු.33,500,000 ක් පිරිවැය | ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කාර්යයන් වර්ෂය තුළ ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වූ කාර්යයන් 02 ක් ලංසු නොගැලපීම සහ ඇස්තමේන්තු වෙනස් කිරීමට කාලය සීමාවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | |

## 3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර තිබුණු රු. 29,310,000 ක ප්‍රසම්පාදන කාර්යයන් 04 ක් වර්ෂය තුළ අවසන් කිරීමට යෝජිතව තිබුණ ද, වැඩ අවසන් කිරීමට හැකිවී තිබුණේ සියයට 50 කට වඩා අඩු ප්‍රමාණයකි. | රටෙහි පවතින ආර්ථික අර්බුදය හමුවේ ඩොලරයේ අගය විශාල ලෙස වැඩි වීම හේතු කොටගෙන අදාල සැපයුම්කරුවන්හට ප්‍රසම්පාදන කටයුතු කර ගැනීමේ අපහසුතා පැන නැඟීම හා කොරෝනා වසංගත තත්වය නිසා කාර්යාල වසා දැමීම හේතුවෙන් එම කාර්යයන්හි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු ප්‍රමාණයක් විය. | ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කාර්යයන් වර්ෂය තුළ ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව යාවත්කාලීනව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබූ අතර මේ වනවිටත් එම කටයුතු අවසන් කර විගණකාධිපති වෙත වාර්තා යොමු කර නොතිබුණි. | 2021 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණය මේ වන විට අරඹා ඇති අතර ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු යාවත්කාලීනව සිදුකර වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 නොවිසඳුණු විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක: ජේපිඒ/බී/පිඒආර් /එෆ්එස්/2020/01 හා 2021 ජූලි 05 දිනැති 2020 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 3.4 ජේදයහි දැක්වෙන , " සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වු 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන වෙළද හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර ඇති, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියට පටහැනිව, ජොෂ්ඨ මට්ටමේ විධායක තනතුරක වසර හයක සක්‍රීය සේවා කාලයක් නොමැති පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම " සම්බන්ධයෙන් වන විධිමත් අනුමැතියක් විගණනය වෙත මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි. | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිර්ණායක පදනම්ව ඔවුන්ගේ එකඟතාවය මත පාර්ලිමේන්තුවේ අදාළ නිලධාරීන් වෙත සහනදායි මෝටර් වාහන බලපත්‍ර ලබා දීම දීර්ඝ කාලයක සිට කැබිනට් අනුමැතිය සහිතව සිදු කරන ලදී. පසුව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ඊට පටහැනි මතයක් ඉදිරිපත් කර තිබීම හා . විගණන විමසුමක් මගින් මෙම කරුණ අවධානයට ලක් කල බැවින් එතෙක් එම පදනම මත පිහිටා සහනදායී බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය තාවකාලිකව අත්හිටුවන ලදී. මහාභාණ්ඩාගාරය මගින් සිදු කරන ලද විමසීමේදී දැනට ඇති චක්‍රලේඛ ප්‍රතිපාදන මත එම සහනය ඉදිරියේදී පාර්ලිමේන්තු කාර්යය මණ්ඩලයේ අදාල නිලධාරීන් වෙත ලබා දිම සුදුසු නොවන බව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් 2022.02.14 දින ලිඛිතව ගරු කථානායකතුමා වෙත මටද පිටපතක් සහිතව දන්වා ඇත. ඒ අනුව එම පදනම මත සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරිම අත්හිටුවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ පැවැත් විය යුතු අවම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව හෝ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.<br><br>ඉදිරියේදී උපරිම විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට උපදෙස් ලබා දෙන ලදී. | අවම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව හෝ පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 5 මානව සම්පත් කළමනාකරණය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ ) | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1082 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 927 ක් වූ බැවින් පුරප්පාඩු 159 ක් හා අතිරික්ත 4 ක් විය.ඒ අනුව සමස්ථ කාර්ය මණ්ඩලයේ සියයට 14 ක පුරප්පාඩු පැවතුණි. | 2021 දෙසැම්බර් මස 31 දිනට කාර්ය මණ්ඩලයේ මුළු පුරප්පාඩු 159 ක් පැවති ඇත. | අනුමත කාර්යය මණ්ඩලයක් පවත්වා ගත යුතු අතර පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනියම්/කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාව 08 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 12 ක් වුයෙන් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 04 දෙනෙක් බඳවා ගෙන තිබුණි. | අයවැය විවාදය පැවති කාල සීමාව තුළ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සේවා අවශ්‍යතාවය මත විශ්‍රාම ගන්වන ලද නිලධාරීන් 03 දෙනෙකු දෛනික පදනමට සේවයේ පිහිටුවා ඇති අතර, විශ්රාම ලබා සිටි වෙනත් නිලධාරියකු අනියම් පදනම මත පත් කර තිබුණි. ඉහත නිලධාරීන්ගේ සේවය 2021.12.31 දිනෙන් අවසන් කර ඇත. | අනුමත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |